# උපයෝගිතා පර්යේෂණ - ව්‍යාප්ති සේවය සහ රබර් ගොවියා

ඩී. ඩී. දසනායක*

(1) ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් 1989 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර ඇති උපයෝගිතා පර්යේෂණ වැඩ සටහන, උපදේශක සේවා දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති සේවය සහ රබර් ගොවියා සමග අන්‍යෝන්‍ය සම්බන්ධ තාවයකින් යුක්තව සාර්ථක අයුරින් දියත් වී ඇත. මෙහි ගොවි අංශය ගැන සැළකීමේදී උද්යෝගිමත් මෙන්ම අත්හද බැලීම් කෙරෙහි කැමැත්තක් දක්වන ගොවීන් මෙම වැඩසටහ නෙහි ක්‍රියාත්මක සාමාජිකයින් වී ඇත. මෙම වැඩ සටහන මගින් රබර් වගාව කෙරෙහි ඇති වී තිබෙන බලපෑම් සම්බන්ධව කරුණු විමර්ශණය කිරීම මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණ වේ.

## (2) කෘෂිකාර්මික පර්යේෂණ සේවාවක තිබෙන වැදගත්කම

ආර්ථික විද්‍යාත්මක ඇසින් කෘෂිකර්මාන්තය දෙස බැලීමේදී එය විවිධ ප්‍රමාණයේ වගා ඒකක වලින් සැදි ව්‍යාපාර සමූහයක් ලෙස දැකිය හැක. ව්‍යාපාරයක් යනු ප්‍රධාන වශයෙන් පවතින නිෂ්පාදන සාධකවල මිශ්‍ර කිරීමක් මගින් යම් නිමවුමක් බිහි කිරීම සඳහා සකස් වී ඇති නිපයුම් ඒකක ලෙස දැක්විය හැක. මෙහිදී තාක්ෂණය අනෙකුත් පවතින සාධකවලට වඩා වෙනස් ස්වරූපයක පවතින බව නිරීක්ෂණය කළ හැක. සෙසු සාධක මිශ්‍ර කරනු ලබන්නේ කුමණ වට්ටෝරු මතද යන ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන්නේ තාක්ෂණය යන සාධකයෙනි. මේ යටතේ නව ශිල්පීය ක්‍රම නිර්මාණය වීම සිදුවන අතර සාමාන්‍යයෙන් පර්යේෂණ අංශය ලෙස මෙය හඳුන්වනු ලැබේ. පර්යේෂණ ආයතන මෙහි ක්‍රියාකාරී ඒකක ලෙස සැළකේ. විවිධ විෂයයන් යටතේ පිහිටුවා ඇති මෙම ඒකකවල මූලික කාර්යභාරය වී ඇත්තේ අදළ නව ශිල්පීය ක්‍රම හඳුන්වාදීම වේ.

## (3) පර්යේෂණවල විවිධ අවස්ථා

(i) මූලික පර්යේෂණ
උදහරණ: වැඩි ඵලදාව ඇති රබර් ක්ලෝන හඳුන්වාදීම

(ii) ව්‍යවහාරික පර්යේෂණ
උදහරණ: පොලිතින් කවරවල සිටවූ පැල මගින් අක්කරයකට අවශ්‍ය පැල 100% ලෙස වර්ධනය කරගැනීමට හැකිවීම.

(iii) තාක්ෂණවර්ධන පර්යේෂණ
උදහරණ: වැසි ආවරණ

(iv) උපයෝගිතා පර්යේෂණ
උදහරණ: පර්යේෂණ බිමෙහි අත්හද බැලීම් ගොවිබිමට ආදේශකර එමගින් තාත්වික නිර්දේශයන් ඉදිරිපත් කිරීම. විවිධ විෂයන් යටතේ ක්ෂෙත්‍රයෙහි ක්‍රියාත්මක කර තිබීම.

මෙම ඉහත දක්වෙන පර්යේෂණ අවස්ථා හතර අතුරින් උපයෝගිතා පර්යේෂණ වැඩ සටහන සම්බන්ධව මෙහි පහතින් කරුණු ඉදිරි පත් කර ඇත.

## (4) උපයෝගිතා පර්යේෂණ සංකල්පය

බෙනර් සහ බැක්ස්ටර් (1984) ට අනුව උපයෝගිතා පර්යේෂණ යනු ගොවීන්ගේ

* දිසා උපදේශක නිළධාරී, කෑගල්ල.

තාත්වික වගා ක්‍රම එනම් ඔවුන් සතුව තිබෙන සම්පත්, හැකියාවන් සහ ඔවුනට හුරු වගා ක්‍රම යටතේ පර්යේෂණ බිමෙහි කරනු ලබන අත්හද බැලීම්වල ක්ෂේත්‍ර උපයෝගිතාවය පර්යේෂණ ස්වරූපයකින් විමර්ශණය කර බැලීමක් ලෙස සහ ඒ අනුව වගා නිර්දේශයන් ඉදිරිපත් කිරීමක් ලෙස දක්විය හැක. මෙම වැඩසටහන සාමාන්‍යයෙන් රබර් පර්යේෂණායතනයේ මූලික වගකීමක් බවට පත්ව ඇත. මෙමගින් පර්යේෂණ භූමියෙහි ක්‍රියාත්මකවූ පර්යේෂණවල ප්‍රතිඵල ක්ෂේත්‍රයෙහි තාත්වික ගොවි වගා තත්වයන් යටතේ තහවුරු කරගනු ලබනවා මෙන්ම රබර් ගොවීන්හට එකී පර්යේෂණ ක්‍රම පිළිබඳව ආදර්ශනය කරවීමක්ද මෙහිදී සිදුවේ. කෙසේ වුවද වාර්ෂික බෝගයක් වන රබර් භෝගය තුළින් ක්ෂණිකව ප්‍රතිඵල ප්‍රදර්ශනය වීම් අපේක්ෂා කළනොහැකි බවද සැලකිය යුතුව ඇත.

## (5) උපයෝගිතා පර්යේෂණ වැඩසටහනෙහි මූලික අරමුණ

(i) පර්යේෂණායතන භූමියෙහි ලබා ඇති පර්යේෂණ ප්‍රතිඵල විවිධ දේශගුණික, පාංශුසාධක, ගොවි සම්පත් සහ විය හැකි අවදනම් තත්වයන් යටතේ ගැල පෙනු ලැබේද යන්න සොයා බැලීම කෙරෙහි පහසුකම් සළස්වා ගැනීම.

(ii) පර්යේෂණ ප්‍රතිඵල තාත්වික ගොවි තත්වයන්ට ගැලපෙන පරිදි විකරණය කිරීම සඳහා විමර්ශණය සහ අගය කිරීම.

(iii) ලාභදායී සහ ඵලදායී බව වර්ධනය කිරීම කෙරෙහි ඇතිවන ගොවි ප්‍රතික්‍රියා සහ ගොවි ආකල්ප වෙනස්වීම් නිරීක්ෂණය කිරීම කෙරෙහි පහසුකම් සළස්වා ගැනීම.

(iv) දෙන ලද ගොවි සම්පත් ප්‍රමාණයන් යටතේ නවඅත්හද බැලීම්වලින් අපේක්ෂිත ප්‍රතිඵලවල ඇතිවීමට ඉඩ ඇති නොපිරි මැසුම් සීමා කුඩාකර ගැනීම.

(v) සාමාන්‍ය ගොවි වගා ක්‍රම සහ ගොවි ආකල්ප ගැන පර්යේෂණ මෙන්ම ව්‍යාප්ති අංශයට අන්‍යොන්‍ය අවබෝධයක් ලබා ගැනීම සහ ඒ අනුව තම සේවාවන් හැඩ ගස්වා ගැනීම.

(vi) ඉහල සිට පහලට ගලා එන පර්යේෂණ තේමාවන් නොව පහල සිට ඉහලට යන පර්යේෂණ තේමාවන් කෙරෙහි නැඹුරුවීමට වාතාවරණයක් ඇතිවීම. මෙය ඉතා ප්‍රායෝගිකය.

## (6) උපයෝගිතා පර්යේෂණ කණ්ඩායම සකස්වී ඇති අන්දම

පර්යේෂණ ඒකකය

i. ප්‍රධාන විද්‍යාඥ - ශාඛ අභිජනන විද්‍යා අංශය

ii. ප්‍රධාන විද්‍යාඥ – ශාඛ විද්‍යා අංශය

iii. ප්‍රධාන විද්‍යාඥ – පාංශු රසායන අංශය

iv. ප්‍රධාන විද්‍යාඥ - ශාඛ ව්‍යාධි විද්‍යා අංශය

v. සහකාර විද්‍යාඥයින් සහ සංවර්ධන නිලධාරීන් (උපයෝගිතා පර්යේෂණ අංශය)

ව්‍යාප්ති ඒකකය

i. ප්‍රධාන සංවර්ධන නිලධාරි - උපදේශක සේවා දෙපාර්තමේන්තුව


ii. දිසා උපදේශක නිළධාරි – උපදේශක සේවා දෙපාර්තමේන්තුව

iii. ප්‍රාදේශීය රබර් ව්‍යාප්ති නිළධාරීන් - උපදේශක සේවා දෙපාර්තමේන්තුව

iv. ක්ෂේත්‍ර නිලධාරීන් - උපදේශක සේවා දෙපාර්තමේන්තුව

රබර් පර්යේෂණායතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ මහතා මෙම වැඩ සටහන සමායෝජනය කරනු ලබන අතර මෙය රබර් පර්යේෂණායතනයේත් උපදේශක සේවා දෙපාර්තමේන්තුවේත් ඒකාබද්ධ වැඩ සටහනක් ලෙස ආයතන දෙකෙහි සාමාන්‍ය වැඩ සටහන් වලට අන්තර්ගත කර ඇත. මෙහි ප්‍රාදේශීය රබර් ව්‍යාප්ති නිලධාරීන් මෙන්ම ක්ෂේත්‍ර නිලධාරීන් ක්‍රියාකාරී කණ්ඩායමක් ලෙසින් තම කොට්ඨාශ තුළ පිහිටා තිබෙන රබර් ගොවීන්ගේ තෝරාගත් බිම්වල පර්යේෂණ මෙහෙයවුම් මෙන්ම නඩත්තු කටයුතු සාර්ථක ලෙස කරනු ලබති.

## (7) උපයෝගිතා පර්යේෂණ වැඩ සටහනෙහි ආකෘතිය




ඉහත රූපයෙහි දක්වෙන වෘත්ත තුනෙන් රබර් පර්යේෂණායතනය, උපදේශක සේවා දෙපාර්තමේන්තුව සහ රබර් ගොවියා යන ඒකක තුන පිළිබිඹු වේ යැයි සැළකූ විට 'ඩී' යන වෘත්ත තුනටම පොදු කොටස උපයෝගිතා වැඩ සටහන ලෙසද, 'ඒ' යනු ගොවියා සහ උපදේශක සේවා දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ඉටු කරන සේවාවන් ලෙසද, 'බී' යනු පර්යේෂණායතනය සහ උපදේශක සේවා දෙපාර්තමේන්තුව ඒකාබද්ධව කරන සේවාවන් ලෙසද සහ 'සී' යනු ගොවියා සහ පර්යේෂණායතනය එකාබද්ධව කරන සේවාවන් ලෙසද වැඩි දුරටත් සළකා ඇත.

ඒ ඒ ආයතන ඒකාබද්ධව කරනු ලබන සේවාවන් 'ඒ' 'බී'සහ'සී' කොටස්වලින් දක්වෙන ක්ෂෙත්‍රඵලවලට අනුලෝමව සමානුපාතික වන්නේ යැයි සළකනු ලැබුවහොත් ('ඒ' හි ක්ෂෙත්‍ර ඵලය> 'බී'හි ක්ෂෙත්‍රඵලය> 'සී'හි ක්ෂෙත්‍රඵලය) ලෙස පෙනී යනු ඇත. එසේම එක් එක් වෘත්තයේ ශේෂ ක්ෂෙත්‍රඵලයෙන් දක්වෙන්නේ ඒ ඒ අංශයන් මගින් මෙම වැඩසටහන සඳහා තනිව දයක වන සේවා ප්‍රමාණය යැයි සළකා ඇත. ඉහත කී අංශ තුනෙන් වෙන් වෙන් වශයෙන් කෙරෙන සේවාවන් සහ ඒකාබද්ධව කෙරෙන සේවාවන් මෙහි පහතින් දක්වා ඇත.

## (8) උපයෝගිතා පර්යේෂණ වැඩ සටහනෙහි ක්‍රියාත්මක ව්‍යුහය

### 8.1. ඒ ඒ අංශවලට පමණක් සීමාවන සේවාවන්

### 8.1.i. පර්යේෂණ අංශයට පමණක් සීමා වූ සේවාවන්

i. වැඩ සටහන් සැළසුම් කිරීම මේ සඳහා රබර් පර්යේෂණායතනයේ අන්තර් දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය යටතේ රබර් ගොවියාගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කර ඒ අනුව කිරිකැපීම, අතුරු භෝග වගාව, බහුභෝග වගාව, අස්වනු උත්තේජනය, වැසි ආවරණ යෙදීම, කාබනික පොහොර භාවිතය, සහ ක්ලෝන අත්හද බැලීම වැනි පර්යේෂණ සැළසුම් කර ක්ෂෙත්‍රයෙහි දියත් කර ඇත.

ii. උපදේශක සේවා දෙපාර්තමේන්තුව මගින් අපේක්ෂිත සේවාවන් ලබා ගැනීම කෙරෙහි ඔවුන් වෙත පැවරෙන වගකීම් පැහැදිලි ලෙස හඳුන්වා දීම.

iii. අවශ්‍ය යෙදවුම් ද්‍රව්‍ය නොමිළයේ සපයා දීම.

iv. වැඩ සටහන සඳහා අවශ්‍ය වන බාහිර ආයතන සමග සම්බන්ධීකරණය

v. වැඩ සටහන කාර්යක්ෂමව මෙහෙයවීම.

### 8.1.2. උපදේශක සේවා දෙපාර්තමේන්තු-වට පමණක් සීමා වූ සේවාවන්

i. ප්‍රාදේශීය නිලධාරීන්ගේ මෙහෙයවීම මත ක්ෂෙත්‍ර නිලධාරීන් සුදුසු ඉඩම් තෝරාදීම.

ii. ක්ෂෙත්‍ර නිලධාරීන් විසින් යෙදවුම් ද්‍රව්‍යය බෙදහැරීමේ කටයුතු මෙහෙයවීම සහ සහායවීම.

iii. වගා අවසර පත්‍ර ලබාගැනීමට ගොවීන්ට සහායවීම.

iv. වගාකරුවන් සඳහා පුහුණු වැඩ සටහන් දියත් කිරීම.

v. වාර්තා සකස් කිරීම කෙරෙහි ගොවීන් නැඹුරු කිරීම.

vi. වගා දත්තයන් වල වැදගත්කම ගොවීන්ට අවබෝධ කරවීම.

vii. අවශ්‍ය වෙනත් වගා සහායයන් ලබාදීම.

viii ප්‍රාදේශීය මෙන්ම දිස්ත්‍රික් මට්ටමේ වැඩ සටහන් සම්බන්ධීකරණය කිරීම.

### 8.1.3. රබර් ගොවීන්ට පමණක් සීමා වූ සේවාවන්

i. ඉඩම සුදුසු පරිදි ශුද්ධ කිරීම

ii. වාර්තා සටහන් තබා ගැනීම

iii. තමන්ගේ වගා කළමණාකරන දක්‍ෂතා ප්‍රයෝජනයට ගැනීම

iv. ගොවීන් තමන් විසින්ම ම අත්හද බැලීම් කරති. ඒවා ව්‍යාප්ති සහ පර්යේෂණ අංශවලට යොමු කිරීම

## 8.2. පර්යේෂණ, ව්‍යාප්ති සහ ගොවි අංශ යන්හි ඒකාබද්ධ යුගල සේවාවන්

### 8.2.1. ගොවි සහ ව්‍යාප්ති ඒකාබද්ධ සේවාවන්

i. ඉඩම් සකස් කිරීමට උදව් දීම

ii. පැල සිටුවීමේ ක්‍රමය පිළිබඳ උපදෙස් දීම

iii. යෙදවුම් ද්‍රව්‍ය සැපයීම

iv. සටහන් තබා ගැනීමට උදව් දීම.

v. සාමූහික ව්‍යාප්ති ක්‍රියාකාරකම්

### 8.2.2. ගොවි සහ පර්යේෂණ ඒකාබද්ධ සේවාවන්

i. ඉඩම් පරීක්‍ෂා කර ගැටලු ඇති ස්ථානවලට උපදෙස්දීම

ii. සංවර්ධන සහ පර්යේෂණ නිලධාරීන් නිරන්තරව ඉඩම් පරීක්‍ෂා කිරීමට යෑම

### 8.2.3. පර්යේෂණ සහ ව්‍යාප්ති ඒකාබද්ධ සේවාවන්

i. උපයෝගිතා පර්යේෂණ වැඩ සටහන් රාමුව නිර්මාණය කිරීම

ii. මෙම අංශ දෙක මගින් වැඩ සටහන් ඒකාබද්ධව ඇගැයීම

iii. අංශ දෙකෙහි සම්බන්ධීකරණයෙන් යෙදවුම් ද්‍රව්‍ය සැපයීම

iv. මාස දෙකකට වරක් සමාලෝචන රැස්වීම් පැවැත්වීම

## 8.3. පර්යේෂණ - ගොවි - ව්‍යාප්ති අංශ තුනෙහි පොදු ඒකාබද්ධ සේවාවන්

i. අදාළ ගොවීන් මෙන්ම නිලධාරීන් පුහුණු කිරීම සහ පුහුණුව ලැබීම යන අධ්‍යයන සංරචකයන් මෙම අංශ තුනෙහිම අවධානය යොමු වන කේන්ද්‍ර සාධකයවී ඇත. මෙය ප්‍රායෝගික තත්වයට පත්වනුයේ පුහුණු මධ්‍යස්ථානයේදීය. උපයෝගිතා පර්යේෂණ පූර්ණ වැඩ සටහන ගැනම අවබෝධයක් පර්යේෂණ නිලධාරීන් විසින් ව්‍යාප්ති-ගොවි අංශ දෙකටම ලබාදෙනු ලැබේ.

ii. යෙදවුම් ද්‍රව්‍ය ප්‍රමාණයන් ව්‍යාප්ති අංශයේ මෙහෙයවීම මත බෙද දෙනු ලැබේ. පර්යේෂණ සහ ව්‍යාප්ති යන අංශ දෙක මගින්ම ගොවීන් වෙත වගා සහ නඩත්තු උපදෙස් දෙනු ලැබේ.

iii. පර්යේෂණ සහ ව්‍යාප්ති අංශය සාමූහික රැස්වීම්, ආදර්ශණ මගින් අවශ්‍ය දැනුම ගොවීන් වෙත ලබාදේ.

iv. පර්යේෂණ සහ ව්‍යාප්ති අංශයේ නිලධාරීන් ක්‍ෂෙත්‍රයේදී ගොවීන් හමුවී මෙකී අංශ තුනම සාමූහිකව ක්‍ෂෙත්‍රයේ එකට වැඩ කරන තත්වයක් ඇති වී තිබීම. මෙය ඉතා වැදගත් අවශ්‍යතාවයකි.

## 9. පර්යේෂණ - ව්‍යාප්ති - සහ ගොවි අංශයන්හි අන්තර් සබඳතා

පර්යේෂණ,ව්‍යාප්ති සහ ගොවි යන අංශ තුන මගින් ඉහත දක්වූ ක්‍රියාකාරකම් ඉටු කරනු ලැබීම තුළින් ඒ ඒ අංශ එකිනෙක සමඟ ප්‍රායෝගීකකරණ මෙන්ම ආයතනිකකරණ සබඳතා වර්ධනය වී ඇත. මෙම සබඳතා මගින් උපයෝගිතා පර්යේෂණ වැඩ සටහන් වර්ධනය වන ගතික තත්වයකට පත්වී ඇත. මෙහිදී ප්‍රායෝගික කාරක සබඳතා පර්යේෂණ සහ තාක්‍ෂණික හුවමාරු ක්‍රියාකාරකම්වලට අදාළවද, ආයතනික කාරක සබඳතා යෙදවුම් ද්‍රව්‍යය, ශ්‍රමය, මූල්‍යසාධක සහ තොරතුරු සැපයීමේ වැඩසටහන් අනුගමනය කරවනු ලබන පුද්ගලයින්ට මෙන්ම ආයතනවලට අදාළවද සකස් වී ඇත.

## 10. සබඳතා සහ ඒවායේ ලක්‍ෂණ

සාමාන්‍යයෙන් සබඳතා යනු කරුණු දෙකක් හෝ වැඩි ගණනක් හෝ එකකට එකක් සම්බන්ධ කරවීමෙන් බිහිවෙන ක්‍රියාදමයක් ලෙස සැළකෙන අතර පසුව ඒවා සාමාන්‍ය නිත්‍ය ක්‍රියාකාරීත්වයන් බවට පත් වනු ඇත. මෙවායේ දැකිය හැකි සාමාන්‍ය ලක්‍ෂණ කිහිපයක් පහතින් සඳහන් කර ඇත.

i. ඒවා සම්මත ක්‍රමවලට එකඟ (විධිමත්) හෝ එකඟ නැති (අවිධිමත්) බව, නිත්‍ය හෝ නිත්‍ය නොවන බව, ස්වේච්ඡා හෝ ස්වේච්ඡා නොවන බව, ස්ථිර හෝ ස්ථිර නොවන බව.

ii. ඒවා පහසුකම් ක්‍රියාකාරිද නැතහොත් පාලන ක්‍රියාකාරීද යන වග,

iii. හුවමාරු කරගන්නා සම්පත්, වර්ග සහ ප්‍රමාණයන් පිළිබඳව,

iv. මෙම සබඳතා ක්‍රියාත්මක වන පරිපාලන මට්ටම් පිළිබඳව,

v. ඒවා වැඩ සටහන් ක්‍රියාකාරිද, ක්‍රියාත්මක කිරීම් කෙරෙහි යොමුවූ ඒවාද නැතහොත් ඇගැයීම් සඳහා යොමු වූ ඒවාද යන වග,

vi. සම්බන්ධ වී සිටින පුද්ගලයන් පිළිබඳව,

vii. සම්පත් ක්‍රමවත් ලෙස සහ නිල අනුමැතිය ඇතිව යොදවනු ලැබුවේද යන්න යන කරුණු කෙරෙහි යොමුවී ඇත.

විධිමත් යනු නිල අනුකූලතාවය අවශ්‍ය වන්නේද නොවන්නේද යන බව සැළකෙන අතර මෙයට කමිටු, කාර්ය සාධක, ඒකාබද්ධව වැඩ කිරීමේ ඒකක, නිලධාරීන්, කෘෂිසංනිවේදන ඒකක, ඒ ඒ විෂය දනුමධාරීන්, සාමූහික ක්‍රියාකාරකම් ප්‍රකාශන සේවා සැපයුම් සහ ආදර්ශණ යනාදිය අන්තර්ගත වේ. අවිධිමත් සබඳතා වලින් නිල අනුකූලතාවයකින් තොරව තොරතුරු සහ සම්පත් හුවමාරුව වැනි අංශ සැළකෙන අතර මේවා සුහද මෙන්ම විශේෂ සම්බන්ධතා මතද ක්‍රියාත්මක වේ.

නිත්‍ය සබඳතා වඩා ස්ථිර වන අතර ඒවා ආයතනික ගත වී ඇත. ක්ෂණිකව ක්‍රියාත්මක වන සබඳතා තාවකාලික ලෙස සැළකේ. එසේම ස්වේච්ඡා සබඳතා මගින් මෙම වැඩ සටහන්වලට සහභාගි වන අයද සිටිති. මෙය බොහෝ විට සිදුවන්නේ ගොවි ඒකකයේ පමණි. බොහෝ සබඳතා ක්‍රියාත්මක වන්නේ පහසුකම් සැළසීමේ යාන්ත්‍රණ ස්වරූපයෙනි. කෙසේවුවද උපයෝගිතා පර්යේෂණ වැඩ සටහන හඳුන්වා දීම රබර් කෘෂිකාර්මික දනීම සහ තොරතුරු පද්ධතියේ ශුභවාදී වෙනස්වීම් ඇතිවන අයුරින් මෙන්ම පවතින සබඳතා දඩිවන ස්වරූපයෙන් නිර්මාණයවී සිදුවන බව පෙනේ.

## 11. උපයෝගිතා පර්යේෂණ වැඩ සටහනෙහි ඇති සබඳතා ඇගැයීම.

i. පර්යේෂණ-ගොවි-ව්‍යාප්ති උප පද්ධති තුනම උපයෝගිතා වැඩ සටහන මගින් ඒකාබද්ධවීම. මේ නිසා රබර්-ගොවි දනුම සහ තොරතුරු පද්ධතියෙහි එක් ක්‍රියාකාරි ඒකකයක් ලෙස උපයෝගිතා වැඩ සටහන සංයුක්ත වීම.

ii. නව තාක්ෂණික ක්‍රම ජනිත වීම. උදහරණ: තේ, රබර් ඒකාබද්ධ වගාව කිරිකැපුම් ක්‍රම, නව ක්ලෝන හඳුන්වා දීම වැනි කරුණු කෙරෙහි නිර්දේශ ඉදිරිපත් කිරීම.

iii. නව තාක්ෂණික ක්‍රමවල ඇති අදළ බව. එනම් ගොවි අවශ්‍යතාවලට ගැලපෙන බව.

iv. සම්පත් ඌණ ගොවියා නව තාක්ෂණය කෙරෙහි දක්වන ප්‍රතිචාරය. මෙහි සෑම තාක්ෂණයක්ම ඵලදයිතාවය හෙවත් වැඩි ආදයම් ලබාදීම කෙරෙහි යොමු කර ඇත.

v. ආයතන අඛණ්ඩව නොවැටී පැවැත්මේ ස්වභාවය තහවුරුවීම. ආයතන කෙරෙහි ඇතිවන විශ්වාසනීයත්වය මත අදළ ආයතන කුඩා රබර් ගොවියා අතරට වඩා සමීපවීම.

## 12. උපයෝගි වැඩ සටහන් මගින් ඇතිවන වක්‍ර ප්‍රතිඵල.

i. අත්හද බැලීම් යනු අවදනම් දරීමකි. උපයෝගිතා පර්යේෂණ වලදී අශුභවාදී ප්‍රතිඵල ලැබුනහොත් එම අවදනම දරන්නේ කෙසේද?

ii. වැඩ සටහනට සහභාගී වන්නන් පර්යේෂණ නිලධාරීන්ට විවෘත වීමේ අවස්ථා වැඩිවීම. මෙයින් පර්යේෂණ-ව්‍යාප්ත-ගොවි පද්ධතිය වඩා ශක්තිමත් වීම.

iii. රබර් පර්යේෂණායතන නිර්දේශවලට අනුව ගොවීන්ට තම ඉඩම් නඩත්තු කළ හැකිවන්නේද යන්න ගැන අස්ථානික බිය ඇතිවීම.

iv. පර්යේෂණ ගැන ගොවීන්ගේ මෙන්ම ව්‍යාප්ති අංශයෙහි තිබෙන අල්ප දැනීම.

v. කුඩා රබර් වතු හිමියන්ගේ අශුභවාදී පසුබස්නා ස්වභාවය.

මෙම වැඩ සටහන මගින් පර්යේෂණ-ගොවි - ව්‍යාප්ති උප පද්ධති තුනම ගතික ක්‍රියාකාරී තත්වයකට පත්කරවන අතර එමගින් ගොවීන්ගේ රබර් වගාවන්හි ඵලදායිතාවය වර්ධනය කරවන නිර්දේශ නිකුත් කිරීමක් සිදුවන අතර ප්‍රාථමිකව ගොවිජීවන තත්වය උසස්වීමත්, දෙවනුව රාජ්‍ය ජාතික ආදායම වර්ධනය වීම කෙරෙහිත් බලපානු ඇත.

## 13. උපයෝගිතා පර්යේෂණ වැඩ සටහන ඇගයීම සහ සාරාංශය.

මෙම වැඩ සටහන මගින් පහත සඳහන් ශුභවාදී අංශ වර්ධනය වන බව නිරීක්ෂණය කළ හැක.

i. පර්යේෂණ – ගොවි – ව්‍යාප්ති සබඳතා දුර්වල නොවී පුළුල්වීම, වර්ධනය වීම, සහ ශක්තිමත්වීම.

ii. කුඩා වතු හිමියන් වක්‍ර ලෙස පර්යේෂණ තත්වයන් ගැන අධ්‍යයනයක් ලැබීම.

iii. රබර් ගොවීන්හට වක්‍ර අයුරින් පර්යේෂණ ව්‍යාප්ති අංශවල භාවිතා වන තාක්ෂණික වචනමාලාවන් මෙන්ම ඒ ඒ විෂයයන්ට අදාළව ගොවීන්ගේ ආවේනික වචන මාලාවන්ද අන්‍යෝන්‍ය වශයෙන් උප පද්ධති තුනටම අධ්‍යයනය කිරීමට අවස්ථාවන් ලැබීම.

iv. කුඩා රබර් වතු හිමියා දැඩි බවක් දක්වන වගා පිළිවෙත් කෙරෙහි වඩා සමීපව අධ්‍යයනය කිරීමට පර්යේෂණ අංශයට හැකිවීම.

v. අසල්වාසීන්ගේ ඉඩම්වල තිබෙන දුර්වලකම් මෙන්ම ඵලදායී පිළිවෙත් මෙම උපයෝගිතා වගා ඒකක සමඟ සංසන්දනය වීමට ඉඩ ප්‍රස්ථා ඇතිවීම.

මෙම වැඩ සටහන් මගින් ඉහතින් දැක්වූ අංශවල වර්ධනයක් ඇති නොවන අංශ සංසන්දනය තුළින් හඳුනා ගැනිමට හැකිවීම සහ ඒවාට පිළියම් සෙවීමේදී මතුවන ප්‍රශ්නද හඳුනාගැනීමට හැකිවනු ඇත. සමස්ථයක් ලෙස සැළකීමේදී උපයෝගිතා වැඩ සටහන රබර් කර්මාන්තයේ යෙදී සිටින සුළු ගොවියාගේ ආර්ථික වර්ධනයත් වගාවේ උන්නතියත් රටේ ජාතික ධනයෙහි ඵලදායි වර්ධනයක් ඇති කිරීමටත් දායක වන බව පෙනී යනු ඇත.